මාගේ අංකය :- JSC/SEC/CIR/2024

**සියලුම අධිකරණ නිලධාරීන් වෙත,**

**විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම**

ශීර්ෂගත කරුණට අදාලව පුනරුත්ථාපන කාර්යාංශයේ අධ්‍යක්ෂ (පුනරුත්ථාපන/පපුප්‍රශා) බ්‍රිගේඩියර් ඩී.සී.සී.ඩී.ආර්.වෛද්‍යාසේකර ආර්එස්පී මහතා විසින් මටද පිටපතක් සහිතව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත යොමු කර ඇති 2024.03.06 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපිය අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකොට ඔබගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 මැයි මස 29 වන දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ANNEXE A-

පුනරුත්ථාපන කාර්යාංශය
புனர்வாழ்வுப் பணியகம்
**BUREAU OF REHABILITATION**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
**MINISTRY OF JUSTICE, PRISON AFFAIRS AND CONSTITUTIONAL REFORMS**

අංක: 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල. | இல: 462/2, கடுவெல வீதி, கனஹேன, பத்தரமுல்ல. | No: 462/2 ,Kaduwela Road , Ganahena , Battaramulla.

මගේ අංකය / எனது இல / My No: පුනකා/ප්‍ර/01/01/2024 ( 23 )

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2024.03. 08

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්,
බන්ධනාගාර මූලස්ථානය.

<u>විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම.</u>

1. මෙම කාර්යාංශය යටතේ පාලනය වන පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුනෙහි දළ වශයෙන් පුනරුත්ථාපනලාභීන් 1120 ක පමණ ප්‍රමාණයක් එකවර පුනරුත්ථාපනය සඳහා යොමු කළ හැකි අතර, තවදුරටත් එම මධ්‍යස්ථානයන් වෙත පුනරුත්ථාපනලාභීන් 500 ක සංඛ්‍යාවක් පමණ ඇතුළත් කර ගත හැකි බැව් දන්වා සිටිමි.

2. ඒ අනුව බරපතල ගණයේ අපරාධ සිදුකළ අයවළුන් (එනම්, මිනීමැරුම්, ස්ත්‍රී දූෂණ හා මංකොල්ලකෑම්) සහ මෙම කාර්යාංශය යටතේ ඇති මධ්‍යස්ථානයන් වෙතින් එක් වරක් පුනරුත්ථාපනය වී ඇති පුනරුත්ථාපනලාභීන් හැර අනෙකුත් පුනරුත්ථාපනලාභීන් පුනරුත්ථාපනය කිරීමේ හැකියාවක් පවතින අතර ඔබ ආයතනය යටතේ ක්‍රියාත්මක අදාළ ආයතන දැනුවත් කර විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවැසි ඉදිරි කටයුතු සිදු කරන මෙන් ඉල්ලා සිටිමි.

3. තවද පුනරුත්ථාපන ක්‍රියාවලිය මාස 06 ක කාල සීමාවක් තුළ සිදු කරනු ලබන බැවින් සහ පුනරුත්ථාපනලාභීන් වරින්වර පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත ඇතුළත් වන ආකාරය අනුව අදාළ කාල සීමාව අවසානයේ සමාජගත කරනු ලබන පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණයන් අනුව අඛණ්ඩව පුනරුත්ථාපන සඳහා යොමු කිරීමේ හැකියාවක් පවතින බැව් වැඩිදුරටත් දන්වා සිටිනු ලැබේ.

ඩී සී සී ඩී ආර් වෛද්‍යසේකර ආර්එස්පී
බ්‍රිගේඩියර්
අධ්‍යක්ෂ (පුනරුත්ථාපන/පසුපුශා)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් වෙනුවට

පිටපත් :
1. ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
2. අධිකරණ සේවා කොමිෂන් සභාව - සියළුම මහේස්ත්‍රාත්වරුන් දැනුවත් කිරීම සඳහා